# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 23 දරන
# බදුල්ලේ ශ්‍රී සද්ධර්මානන්ද සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 1982 මැයි මස 31 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 ජූනි මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

**1982 අංක 23 දරන බදුල්ලේ ශ්‍රී සද්ධර්මානන්ද සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 1982 මැයි මස 31 වන දින]

එල්. ඩී.—ඔ. 41/81

**බදුල්ලේ ශ්‍රී සද්ධර්මානන්ද සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"බදුල්ලේ ශ්‍රී සද්ධර්මානන්ද සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සමිතියක්, එකී සමිතියේ සාමාජිකයන් එකඟ වන රීති අනුව එකී සමිතියට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් බදුල්ලේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු කීපය මෙතෙක් කල් එකී සමිතිය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ සංස්ථාගත කරනු ලැබීම සඳහා ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

කෙටි නාමය.

1. මේ පනත 1982 අංක 23 දරන බදුල්ලේ ශ්‍රී සද්ධර්මානන්ද සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

බදුල්ලේ ශ්‍රී සද්ධර්මානන්ද සමිතිය සංස්ථාගත කිරීම.

2. මේ පනත ආරම්භ වන දින සිට හා ඉන්පසු, (මෙහි මින්මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) එකී බදුල්ලේ ශ්‍රී සද්ධර්මානන්ද සමිතියේ තත් කාලයේ සභාපති, උප සභාපති හා විධායක කමිටුවේ සාමාජිකයෝ ද එකී බදුල්ලේ ශ්‍රී සද්ධර්මානන්ද සමිතියේ සාමාජිකයන්ව දැනට සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කෙරෙන සංස්ථාවට මින්මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයෝ ද "බදුල්ලේ ශ්‍රී සද්ධර්මානන්ද සමිතිය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන්නාහ. එය විසින් හා එයට විරුද්ධව සියලු අධිකරණයන්හි නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම එකී නාමයෙන් කළ යුතු ද, කළ හැකි ද වන්නේ ය. තව ද එකී නාමයෙන් පොදු මුද්‍රාවක් ඇතිව සිටීමේ, පාවිච්චි කිරීමේ හා සංස්ථාවේ අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ශ්‍රී සද්ධර්මානන්ද පිරිවෙණෙහි උන්නතිය සඳහා කටයුතු සංවිධානය කිරීම;

(ආ) පාරිවෙණික අධ්‍යාපන කටයුතු දියුණු කිරීම;

(ඇ) නේවාසික සියලුම භික්ෂූන් වහන්සේලාගේ සිව්පසය පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම;

(ඈ) පිරිවෙන් විහාරස්ථානයෙහි අභිනවයෙන් ගොඩනැගිලි ඉදි කිරීම හා තිබෙන ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම;

(ඉ) ශිෂ්‍ය නිවාසයට හා පිරිවෙණට අවශ්‍ය උපකරණ සැපයීම;

(ඊ) ප්‍රදේශවාසී බෞද්ධ ජනතාවගේ ආගමික කටයුතු දියුණු කිරීම සඳහා විහාර මන්දිරයක් ලබාදීම;

(උ) දහම් පාසැලේ අභිවෘද්ධිය ඇති කිරීම;

(ඌ) ධර්මදේශනා පැවැත්වීම හා බෞද්ධ කටයුතු දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය විධිවිධාන යෙදීම.

විධායක කමිටුව.

4. (1) සංස්ථාවේ රීති අනුව තෝරා පත් කරගනු ලබන තැනැත්තන් ගණනකින් සමන්විත වන විධායක කමිටුවක් විසින් සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබේ.

(2) මේ පනත ක්‍රියාත්මක වන දිනයෙහි ධුර දරන සමිතියේ විධායක කමිටුව සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව වන්නේ ය.

සංස්ථාවේ රීති.

5. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ නෙරපීම සඳහා ද, සංස්ථාවේ විධායක කමිටුවේ හා විවිධ නිලධරයන් ගේ, අනුයෝජිතයන්ගේ හා සේවකයන්ගේ යුතුකම් ඉටුකිරීම සම්බන්ධයෙන් සහ සංස්ථාවේ කටයුතු කරගෙන යාමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පාලනය කිරීම සඳහා හා එහි පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම සඳහා ද, සංස්ථාව විසින්, කලින් කල, සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී හා වැඩි ඡන්දයෙන් මෙම පනතට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එම රීති වෙනස් කිරීම, ආකලනය කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම (2) වන උපවගන්තියේ නියමයන්ට යටත්ව කළ හැකි වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ කිසිදු රීතියක් සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් විනා වෙනස් කිරීම, ආකලනය කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු නොලැබිය යුතු ය. එහෙත් එකී වෙනස් කිරීම, ආකලනය කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම විධායක කමිටුව විසින් කලින් අනුමත කරනු ලැබ තිබිය යුතු ය.

සමිතිය විසින් ගෙවිය යුතු ණය හා සමිතියට අය විය යුතු ණය.

6. මෙම පනතේ කාර්යයන් සඳහා මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවෙහි දී පවත්නා සමිතියේ සියලු ණය හා වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, සමිතියට අයවිය යුතු සියලු ණය හා සමිතියට ගෙවිය යුතු සියලු සහභාග මුදල් හා දායක මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

7. විධායක සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. එකී සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන් ආකාරයකින් සංස්ථාව සතුවන්නා වූ චංචල හෝ නිශ්චල කවර දේපළක් වුව ද භාර ගැනීමටත්, දැරීමටත් නීතිය අනුව සංස්ථාවට හැකියාව ඇත්තේ ය. තව ද විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හෝ අන් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව සංස්ථාව මේ පනතේ කාර්යයන් සඳහා සහ සංස්ථාවේ රීතිවලට යටත්ව එකී සියලු දේපළ දැරිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

9. මෙම පනතෙහි සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින් ඔවුන් කෙරෙහි නොහොත් ඔවුන් යටතේ හිමිකම් පාන්නන් හැර, ජනරජයේ, යම් රාජ්‍යයක, බලයලත් සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.